**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - 2017**

-----------------------------------------------------------------------

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ඔක්තෝබර් 16 දින නිකුත් කර ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) ප්‍රමිතයේ 25 ඡේදය (ආ) පරිදි සමාලෝචිත වර්ෂයේ වාහන විකිණීමෙන් ලද රු.6,057,930ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ii) ප්‍රවර්ථන වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාළ මුදල් ප්‍රවාහය රු.26,753,844ක් ලෙස දක්වා තිබුණද ඒ තුළ මුදලින් ගෙවීම් නොකරන ලද රු.9,803,454 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 65 වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.63,410,396 ක් වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

ප්‍රමිතයේ 15 වන ඡේදය ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට තොග ගිණුම්ගත කළ යුතු වුවත් ආයතනය සතු වසර 03කට වඩා පැරණි උපලබ්ධි වටිනාකමක් නොමැති හා ආයතනය තුළ භෞතිකව නොපවතින තොග ශේෂ 03ක් රු.64,973 ක් වූ අගයකට ඉතිරි තොග යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අයත් එහෙත් දෙසැම්බර් 31 දින වන විටද ගෙවීම් කර නොතිබුණු වාහන 2 ක අලුත්වැඩියා වියදම් රු.259,000ක්වූ බිල්පත් වටිනාකම උපචිත වියදම් ලෙස නොදැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ගෙවියයුතු වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් 03කට අදාලව පොලී ආදායම රු.364,095ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ජංගම ගිණුමකට සෘජුව ලැබී තිබුණු රු.686,153ක් හඳුනාගෙන නිවැරදි ලෙජර් ගිණුම්වලට ගලපා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී සේවකයෙකුගේ රු.67,030ක් වූ දළ වැටුප රු.670,030ක් ලෙස සලකා ගණනය කිරීම හේතුවෙන් රු.6,331,500ක් වැඩියෙන් පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රසායන ද්‍රව්‍ය තොග අයිතම 119 ක වටිනාකම තොග යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ශේෂ ලෙස වර්ෂ 5 කටත් පෙර සිට පැවත එන එකතු වටිනාකම රු.572,222ක්වූ ගිණුම් ශේෂ හතරක් අයකර ගැනීමට ප්‍රවර්ථන වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එකතු වටිනාකම රු.321,174ක් වූ වර්ෂ 2කට වඩා පැරණි අත්තිකාරම් ගිණුම් ශේෂ 4ක් අයකර ගැනීමට ප්‍රවර්ථන වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2004 වර්ෂය සිට නොගෙවූ වැටුප් ලෙස දක්වා තිබූ රු.268,724ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවීමකින් තොරව ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සංවර්ධන ව්‍යාපෘති යටතේ සහන පදනම මත ප්‍රතිලාභීන් වෙත ලබාදුන් වී තම්බන ඇලුමිනියම් උපකරණ අලෙවියෙන් එක්රැස් වූ රු.4,318,284ක් වටිනා ප්‍රතිලාභී දායක මුදල් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ගෙවීමෙන් තොරව 2009 වර්ෂයේ සිට බැරකමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්වා තිබෙන නමුත්, එය නිරවුල් කිරීමට 2018 අගෝස්තු 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

### 2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් අනුව උපචිත වියදම් රු.6,458,146 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වියදම රු.5,924,468 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.533,678 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 570 සහ 571 | 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අයත් රු.134,500ක් වටිනා ටෙන්ඩර් ඇප තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | එකතුව රු.1,002,498 ක් වටිනා තොග වර්ග 6 ක් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| ආ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 ඡේදය | 2016 හා 2017 වර්ෂවල අබලන් වූ වාහන විකිණීමෙන් ලද රු.6,057,930ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |

**2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 10 දෙනෙකු විසින් ලබාගෙන තිබූ රු.217,000ක අත්තිකාරම් මුදලින් රු.107,828ක් විධිමත් අනුමැතියක් රහිතව නවාතැන් බිල්පත් පියවීම සඳහා වැය කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම වියදම පියවීමට කටයුතු නොකර නොපියවූ අත්තිකාරම් යටතේ දක්වා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,193,072ක ඌනතාවයක් ඇතිවී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,506,446ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,313,374ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ස්වයං උත්පාදන ආදායම් රු.5,011,467 කින් වැඩිවීම ඉහත ඌනතාවය අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක දායකයේ වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ දායකය පිළිවෙලින් රු.97,592,080 ක් හා රු.81,224,945 ක් වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1** **කාර්යසාධනය**

-----------------

**4.1.1** **ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) 2015 වර්ෂයේ ආරම්භ කර තිබුණු " Estimation of heave metal contamination in Some Popular vegetables grown in different districts of Sri Lanka යන පර්යේෂණය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද 2018 අගෝස්තු 30 දින වන විටත් එම අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

ආ) 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු " Studies of wine production from locally available groups" යන පර්යේෂණය 2018 මාර්තු අවසන් කිරීමට සැලැසුම් කර තිබුණ ද 2018 ජූනි 30 දින වන විටත් පර්යේෂණයේ අවසන් වාර්තාව සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් පසුගිය වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කර තිබූ විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති 05 ක් විධිමත් ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකිරීම හා විනිවිදභාවයෙන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම හේතුවෙන් විවිධ බාහිර ආයතනවල විමර්ශනයන්ට භාජනය වී තිබුණු අතර එම විමර්ෂණ වල නිර්දේශ හා ඊට වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් 2018 ජූනි 30 දක්වා ආයතනය හෝ කෘෂිකර්ම අමාත්‍යාංශය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබුණු මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.16,076,078 ක් වටිනා උපකරණ 50 % ක ප්‍රජාදායකත්වයක් සහිතව ප්‍රතිලාභීන් වෙත ලබාදීම වෙනුවට අයෙතනයට අයිතිය හෝ භාරකාරත්වය තබා ගනිමින් ගිවිසුම්ගතව ප්‍රතිලාභීන් වෙත නොමිලේ ලබා දී තිබුණි.

**4.3** **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) ආයතනයේ ගිණුම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණ පරිගණක මෘදුකාංගය මිලදී ගෙන මාස 05ක පමණ කාලයක් තුළ එම මෘදුකාංගය පිරික්සුම් පිටපතක් (trial version) ලෙස භාවිතා කරමින් පැවතුණු අතර එය බලපත්‍ර ලත් නීත්‍යානුකූල මෘදුකාංගයක් බවට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වලින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආහාර වර්ග 07ක බැර ලෝහ වර්ග 04ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබුණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,956,120ක වියදමක් දරා නියැදි 500 ක් පරීක්ෂා කර එයින් හඳුනාගත් ප්‍රතිඵල කෘෂිකර්ම අමාත්‍යාංශයට හා අදාළ අනෙකුත් ආයතනයන්ට ඉදිරිපත් නොකර එම වාර්තා රඳවාගෙන තිබුණු නමුත්, එම ව්‍යාපෘතියේ වියදම් වෙනුවෙන් රු.5,350,000 ක් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

ඇ) ආයතනයේ වාහන අවශ්‍යතා වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ආයතනය වෙත ලබා දෙන ලද කැබ් රථ 06ක් සහ ජීප් රථ 01 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන පටිපාටියට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද රහිතව, අලුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට යොමුකර තිබූ අතර 2018 මැයි 30 දක්වා එම වාහන අලුත්වැඩියා කර ආයතනයේ අවශ්‍යතා සඳහා යොදාගෙන නොතිබුණි.

ඈ) ආයතනය විසින් සිදු කරනු ලබන පර්යේෂණ අවසන් වීමෙන් පසු එම පර්යේෂණ සමාලෝචනය කිරීම සඳහා සහ තාක්ෂණය සමාජගත කිරීමට අවශ්‍යය නිර්දේශ ලබා දීමට කටයුතු කරන පර්යේෂණ සමාජගත කිරීමේ කමිටුව සමාලෝචිත වර්ෂය තුළ රැස් වී නොතිබුණි.

**4.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------------**

රු. මිලියන 15.2 ක් වටිනා Gas Chromatography Mass Spectrometry System (GCMS) උපකරණය 2014 වර්ෂයේ දෙසැම්බර් ස්ථාපිත කිරීමෙන් පසුව 2017 දෙසැම්බර් මස 31 දින දක්වා වසර 03ක කාලයක් පර්යේෂණ කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවති අතර මෙම කාලය තුළ මෙම උපකරණ සේවා කිරීම සඳහා ආයතනය විසින් රු.536,255 ක වියදමක් දරා තිබුණි.

**4.5 ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------**

නියමිත දින වලදී බිල්පත් නොගෙවීම හේතුවෙන් ජලය හා විදුලි බිල්පත් පියවීමේදී රු.45,532 ක ප්‍රමාද ගාස්තු ආයතන අරමුදලින් ගෙවා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයෙහි 15.1(II) ඡේදය හා ආයතනයේ බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව නිළධාරියෙකුගේ වැටුප් පරිමාණය නියම කිරීමේදී එහි 4 වැනි වැටුප් පියවරට එලඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු බව දක්වා තිබුණද, ආයතනය තුළ ආරම්භයේ සිට වර්තමානය දක්වා කිසිදු සේවා කාණ්ඩයක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි. කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපවත්වා පරිවාස කාලයේ සිටින නිලධාරීන් වසර 03 ඉක්ම වූ පසු ස්ථිර කිරීම, උසස් කිරීම්,වැටුප් වර්ධක ලබා දීම්ද අඛණ්ඩව සිදුකර තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**----------------------**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

**-----------------------------------------------**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් සහල් සැකසුම්කරුවන්, ගොවි සංවිධාන හා රාජ්‍ය නොවන ආයතන ලෙස පොදුවේ ප්‍රතිලාභීන් ලෙස හඳුනාගෙන තිබූ නමුත්, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක දක්වමින් නිශ්චිත ආයතන හඳුනාගෙන තිබූ බවට හා එම ආයතන සමඟ සහභාගිත්ව ප්‍රවේශයක් නිරූපණය වන බවට නිරීක්ෂණය නොවීය.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඹ සැපයුම් අගයදාම කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට ඇසුරුම් පෙට්ටි නිර්මාණය කර සැපයීම සඳහා ලංසු ඇගයීමේදී ප්‍රවාහන වියදම් පිළිබඳ නොසලකා ඒකක මිල පමණක් සලකා අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ බැවින් ගිවිසුම්ගත මුදල ඉක්මවා රු.63,673ක් ගෙවීම් කර තිබුණි.

(ආ) පැපොල් සැපයුම් අගයදාම කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇසුරුම් පෙට්ටි නිර්මානය කර සැපයීම සඳහා ලංසු කැඳවීමේදී සතියක් තුළ ඇසුරුම් පෙට්ටි 4,000ක් නිර්මාණය කොට සැපයීම අවශ්‍ය බවට කොන්දේසියක් ඇතුළත් කර තිබූ අතර සති 4ක් ඇතුළත සැපයුම සිදුකල හැකි බව දක්වා තිබූ අවම ලංසුව ප්‍රතික්ෂේප කර ඊළඟ අවම ලංසුකරුට ඇණවුම ලබා දී තිබූ නමුත් සැපයුම සිදු කිරීමට මාස 2ක කාලයක් ගත වී තිබුණු හෙයින් පළමු අවම මිල ගණන් සුදුසුකම් ලත් ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ආයතනයට රු.801,760ක අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය ප්‍රකාරව කුලී පදනමට හෝ බදු පදනමට ගොඩනැගිලි ලබා ගැනීමේදී සම්පූර්ණ බදු කාල සීමාවට අදාල බදු වටිනාකම ප්‍රසම්පාදන සීමාව තීරණය කිරීම සඳහා සලකා බැලිය යුතු වුවත්, කොළඹ කාර්යාලය සඳහා කුලී පදනමට ගොඩනැගිල්ලක් ලබාගැනීමට සිදුකළ ප්‍රසම්පාදනයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව වර්ෂ 5ක් සඳහා බදු වටිනාකම රු.මිලියන 28.5 ක් වූ අතර ඒ අනුව ප්‍රසම්පාදන සීමාව ගණනය කිරීමේදී අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවකට යොමුකල යුතු වුවද ඊට පටහැනිව වසර 1 යි මාස 6 ක් සඳහා බදු වටිනාකම වූ රු.මිලියන 8.5 මත සුළු දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය විසින් ගොඩනැල්ල කුලියට ගැනීමට තීරණය කර තිබුණි.

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

ආයතනය විසින් සිදුකරන පර්යේෂණ කටයුතු ගුණාත්මක සහ වෘත්තීය මට්ටමින් සිදු කෙරෙන බවට තහවුරු කර ගැනීම සඳහා ආයතනයේ පිහිටුවා ඇති පර්යේෂණ උපදේශක මණ්ඩලය වසරකට අවම වශයෙන් 4 වරක් වත් රැස්වී පර්යේෂණ යෝජනා හා පර්යේෂණවල ප්‍රගතිය ඇගයීමට ලක්කල යුතු බවට 2010 අගෝස්තු 19 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේදී නියෝගකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයට අදාළ පර්යේෂණ 15ක් පිළිබඳ ඇගයීම් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ උපදේශක සභාව රැස් වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| අ) පර්යේෂණ පාලනය | (i) ආයතනය විසින් සිදුකරනු ලබන පර්යේෂණ සඳහා පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබීම.<br>(ii) පර්යේෂණ උපදේශක මණ්ඩලයේ උපදෙස් ලබාගෙන නොතිබීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) ආයතනයේ කාර්ය මණ්ඩලය විධිමත් පුහුණු වැඩසටහන්වලට යොමුකර නොතිබීම<br>(ii) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණද පවත්වා නොතිබීම |
| (ඇ) රසායනාගාර පාලනය | (i) ආයතනය සතු රසායනාගාරය ප්‍රමිතිකරණයට භාජනය කර නොතිබීම<br>(ii) රසායනාගාර උපකරණවලින් ඵලදායීව ප්‍රයෝජනය ගෙන නොතිබීම.<br>(iii)රසායනාගාර තොග පිළිබඳ භෞතික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබීම. |
| (ඇ) නේවාසිකාගාර පාලනය | විධිමත් පාලන ක්‍රමයක් යොදා ගනිමින් නේවාසිකාගාර ආදායම් අයකර නොතිබීම. |